


# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

Kuma Gamage
0414 215 230
email- ads.sannasa@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ලියා දන්වන වගයි

### සාහිත්‍ය මාසය අවසන්

සැප්තැම්බරය සාහිත්‍ය මාසයයි. සාහිත්‍යය ජනතාව වෙත වඩ වඩාත් ළං කරණු පිණිස විවිධ වූ ව්‍යාපෘති මේ මාසය තුළ ක්‍රියාවට නැංවිණි. ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය හැරුණ කොට විවිධ සාහිත්‍ය සංවාද හා සම්මන්ත්‍රණ මේ වෙනුවෙන් දියත් වූ බව අපි දුටුවෙමු. විවිධ ආයතන විසින් දියත් කරන ලද සාහිත්‍ය සම්මාන ප්‍රදාන සමාජයේ කතා බහට ලක් විය.

දැන් සාහිත්‍ය මාසය අවසන් වී ඇත. සාහිත්‍යය පිළිබඳ වූ කතා බහත් උනන්දුවත් අවධානයත් දැන් දැන් අඩු වෙමින් පවතියි. එය එසේ විය යුතුද?

සාහිත්‍යය යනු යම් කිසි නිශ්චිත මාසයකට පමණක් සීමා වූ දෙයක් ය යන අදහසක් සමාජය තුළ ස්ථාපිත වීම නිවැරදි දෙයක් නොවේ. මිනිසකු ජීවත්ව සිටින තාක් කල් සාහිත්‍ය රස වින්දනය ඔහු සමග පැවතිය යුතුය. ඒ සඳහා කාල වකවානු සීමා කිරීම කළ හැක්කක් නොවේ..

සාහිත්‍යය යනු ආර්ථික ලාභයක් ලබාගත නොහැකි දෙයක්ය යන මතය සමාජය මත ස්ථාපනය කළේ ජේ ආර් ජයවර්ධන රජයයි. "සාහිත්‍යය කන්නද?" කියා ප්‍රසිද්ධියේ ඇසුවේ එතුමා ය. සාහිත්‍යය පාඨශාලා විෂය මාලාවෙන් ඉවත් කළේද එතුමාය. ඉන්පසු බිහි වූ සාහිත්‍යය නොහඳුණන පරම්පරාව බිහිකිරීමේ වගකීමද එතුමාට ය. එහි ප්‍රතිවිපාක දැන් දැන් සමාජය අත් විඳිමින් සිටියි.

සාහිත්‍යය මගින් කලාව මගින් පෝෂණය කළ සිත් කිසිවිටෙක අපරාධ සඳහා නොපෙළඹෙයි. ජීවිතය විඳගන්නට විනා විනාශ කරන්නට කලාකාමී සිත් ඇත්තන් සූදානම් නැත. සාහිත්‍යය විසින් වර්ධනය කළ උසස් මානසිකත්වය සමාජයට අවශ්‍යම දෙයකි. එය සමාජයේ යහපැවැත්ම සාදයි. සමාජ ප්‍රගමණය සාදයි.

එබැවින් සාහිත්‍යය යනු සාහිත්‍ය මාසයට පමණක් සීමා කිරීම නොකළ යුත්තකි. එය නොකඩවා පවත්වාගෙන යා යුතු ව්‍යාපෘතියකි. පාසල් විශ්ව විද්‍යාල කාර්යාල හරහා සාහිත්‍ය ප්‍රගමනයට දායක විය හැකි වැඩ සටහන් ක්‍රියාත්මක විය යුතුය. ඒ සඳහා මැදිහත්වීමේ වගකීම රජයට ඇත. සමාජ සංවිධාන වලට ඇත. මේ සාමූහික ව්‍යායාමය රටේ අනාගතයට සුබදායී බලපෑමක් ඇති කරනු ඇත.



# යහපාලන පොරොන්දු කඩිනමින් ඉටු කිරීමට ආණ්ඩුවට යෝජනා මාලාවක්



**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, කලාකරුවන්, නීතිඥයින්, පරිසරවේදීන්, වෘත්තිකයින් ඇතුළු විද්වතුන් පිරිසකගේ මූලිකත්වයෙන් ජනතා විමුක්ති පෙරමුණ සකස් කරන ලද, ආණ්ඩුව විසින් කඩිනමින් ඉටුකළ යුතු ප්‍රතිසංස්කරණ යෝජනා මාලාවක් ජනාධිපතිවරයාට සහ අගමැතිවරයාට බාරදී තිබේ. එම කටයුත්තට සම්බන්ධ වූ විද්වතුන් දෙදෙනෙක් සහ ජවිපෙ නායකයා ඒ පිළිබඳ මෙසේ අදහස් දක්වති.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, කලාකරුවන්, නීතිඥයින්, පරිසරවේදීන්, වෘත්තිකයින් ඇතුළු විද්වතුන් පිරිසකගේ මූලිකත්වයෙන් ජනතා විමුක්ති පෙරමුණ සකස් කරන ලද, ආණ්ඩුව විසින් කඩිනමින් ඉටුකළ යුතු ප්‍රතිසංස්කරණ යෝජනා මාලාව

01 විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින්ම අහෝසි කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිදුකිරීම.
02 පක්ෂය මාරු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රීධූර අහෝසි කෙරෙන නීති සම්පාදනය

03 අමාත්‍යවරුන් සංඛ්‍යාව 30ට වඩාද, රාජ්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව 40ට වඩාද වැඩි කිරීමට 19වන ව්‍යවස්ථා සංශෝධනයේ ඇති ඉඩකඩ අහෝසි කිරීම හා පාර්ලිමේන්තු පනතක් මගින් අමාත්‍යංශවල විෂය හා ආයතන විද්‍යාත්මක පදනමක් මත සකස්කොට නීතිගත කිරීම.

04 බහුවිධ දේශපාලන ප්‍රවණතාවයන් නියෝජනයට ඉඩ ලැබෙන පරිදි, ජනතාවගේ කැමැත්තපාර්ලිමේන්තුව, පළාත් සභා හා පළාත් පාලන ආයතන තුළ සාධාරණව පිළිබිඹුවන නව මැතිවරණ ක්‍රමයක් පුළුල් ජනතා සංවාදයකින් පසු හඳුන්වාදීම.

05 තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහාවන පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ක්‍රියාත්මක කිරීම.

06 ජාතික විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ක්‍රියාත්මක කිරීම.

07 විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියන්ට විදේශයන්හි සිට ඡන්දය භාවිතා කිරීමට වැඩපිළිවෙළක් සකස්කළ යුතු බැවින් ඒ සඳහා පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවක් පත්කිරීම.

08 ජාතිකත්ව ආගමික හෝ වෙනත් කිසිදු වෙනස්කමක් මත කිසිදු පුරවැසියකු නින්දාවට, අපහාසයට, අසාධාරණයට පත් කිරීම සපුරා තහනම් කෙරෙන අතර එවැනි තත්වයන්ට පාත්‍රවන සියලු දෙනාගේ පැමිණිලි භාර ගැනීමට, ඒවා පරික්ෂණය කිරීමට හා ඒ පිළිබඳ චූදිතයින් අධිකරණයට පැමිණවීමට බලය ඇති "වෙනස්කම් වැළැක්වීමේ කොමිෂන් සභාවක් (Commission Against Discrimination) ස්ථාපිත කිරීම.

09 උතුරේ පැවති තිස් අවුරුදු යුද්ධයෙන් විවිධාකාරයෙන් පීඩාවට පත්වූ හා හානි සිදුවූ සැමට තම දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමටත් ඒවා පිළිබඳ සත්‍ය සොයා බලා පීඩාවට පත්වූවන්ට සහන ලබා දීමටත්ජාතික සමගිය ප්‍රවර්ධනය කිරීමේ හා ප්‍රතිසන්ධානගත කිරීමේ පනතක් මගින් සත්‍ය විමර්ශන කොමිසමක් (Truth and Reconciliation Commission) පත් කිරීම.

10 දැනට වාර්තා වී ඇති සියලු¨ වංචා සහ දූෂණ කඩිනමින් පරික්ෂා කිරීමත්, චූදිතයින්ට වහා දඬුවම් කිරීමත් රජයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම. නීතිපති දෙපාර්තමේන්තුව, රහස් පොලිසිය හා රජයේ විමර්ශන ආයතන දේශපාලන වුවමනාවන් වෙනුවෙන් පරීක්ෂණ යටගැසීමට, කල්දැමීමට යොදා ගන්නා අතීතයේ මෙන්ම වර්තමානයේද පවතින තත්වය වහාම වෙනස් කිරීම.

11 දූෂණ සහ වංචා පිළිබඳව පරික්ෂා කිරීමට සහ වගකිවයුත්තන්ට දඬුවම් කිරීම සඳහා පිහිටුවා ඇති සිය¨ ආයතන වඩාත් ශක්තිමත් කිරීම

12 වන පිටට